2024.08.27

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## කතෝලික ධර්මය

විභාග අංකය :..............................................................

| 6 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

★ අංක 1 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ශුද්ධ බයිබලයේ අඩංගු මුළු පොත් සංඛ්‍යාව
   (i) 46 (ii) 73 (iii) 27 (iv) 50

2. කිතුනු අපේ පූජනීය ග්‍රන්ථය ලෙස ශුද්ධ බයිබලය හැඳින්වීමට හේතුව වනුයේ,
   (i) පොත් 73 ක් අඩංගු විශාල ග්‍රන්ථයක් බැවිනි.
   (ii) ගැළවීමේ ඉතිහාසය පිළිබඳ තොරතුරු අඩංගු බැවිනි.
   (iii) දෙවියන් වහන්සේ පිළිබඳ තොරතුරු ඇතුළත් බැවිනි
   (iv) දේව වචනය අඩංගු බැවිනි

3. පංච පුස්තකය යනුවෙන් හඳුන්වන්නේ,
   (i) ශුද්ධ බයිබලයේ පළමු පොත් පහයි.
   (ii) පැරණි ගිවිසුමට අයත් පොත් සියල්ලයි.
   (iii) නව ගිවිසුමට අයත් පොත් සියල්ලයි.
   (iv) ශුද්ධ බයිබලයට අයත් මුළු පොත් සංඛ්‍යාවයි.

Learning Resource Center
R
De Mazenod College
Kandana

4. ශුද්ධ බයිබලයේ දෙවන පොත වන්නේ,
   (i) උත්පත්ති ය. (ii) නික්මයාම ය. (iii) ගණන් කථාව ය. (iv) ලෙවී ව්‍යවස්ථාව ය.

5. ශුභාරංචි ග්‍රන්ථවල ඇතුළත් මූලික කරුණු වනුයේ
   (i) විශ්වය හා මිනිසා මැවීමයි.
   (ii) දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව පාරාවෝ රජුගෙන් ගළවා ගෙන පොරොන්දු දේශය කරා ගෙන යාමයි.
   (iii) ක්‍රිස්තුස් වහන්සේගේ උපත, සේවය, ඉගැන්වීම්, උකුත්වීම, උත්ථානය, යන සුවිශේෂී සිද්ධීන්ය.
   (iv) මෝසෙස්තුමාගේ දූත මෙහෙවරයි.

6. අයබදු එකතු කළ අයකැමියෙක් වූ, ජේසුස් වහන්සේගේ අපෝස්තුළුවරු දොළොස්දෙනාගෙන් කෙනෙකි.
   (i) ජුදාස් (ii) මතෙව් (iii) පේදුරු (iv) ජාකොබ්

7. සිංහයා සංකේත කරගත් නව ගිවිසුමේ ශුභාරංචිය වනුයේ,
   (i) ලූක් ශුභාරංචිය (ii) මතෙව් ශුභාරංචිය
   (iii) මාක් ශුභාරංචිය (iv) ජොහන් ශුභාරංචිය

8. ශුභාරංචියක් ලියන ලද එකම අන්‍ය ජාතිකයා,

(i) මාක් තුමා ය. (ii) මතෙව් තුමා ය.

(iii) ජොහන් තුමා ය. (iv) ලූක් තුමා ය.

9. "බිය නොවන්න, මෙන්න, සකල ජනයා හට ඉතා ආනන්ද ජනක මංගල පුවතක් මම ඔබ වෙත ගෙනෙමි." යනුවෙන් ජේසු උපත පිළිබඳ පළමු පණිවිඩය ලැබුණේ,

(i) දුප්පත් එඬේරුන්ට ය. (ii) ශාස්ත්‍රවන්තයින්ට ය.

(iii) හෙරොද් රජතුමාට ය. (iv) සාමාන්‍ය ජනතාවට ය.

10. ජේසුස් වහන්සේ කුඩා වියේ සිටම දේව කැමැත්තට අවනත වී යහපත් ගුණාංගවලින් වර්ධනය වූ බව පවසන සුවිශේෂ කතුවරයා,

(i) ජොහන් තුමා ය. (ii) මාක් තුමා ය. (iii) පේදුරු තුමා ය. (iv) ලූක් තුමා ය.

11. ආරම්භක දේව ප්‍රසාද නිධාන පමණක් ඇතුළත් වරණය වන්නේ,

(i) ප්‍රසාද ස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය, අභිවෘද්ධි ආලේපය

(ii) සමගි සන්ධානය, රෝගීන්ගේ ආලේපය, පූජකවරය

(iii) පූජකවරය, ආශිර්වාදකාර බන්ධනය, ප්‍රසාද ස්නාපනය

(iv) සුවදානයේ දේව ප්‍රසාද නිධානය, සමගි සන්ධානය, පූජකවරය

12. ආරම්භක දේව ප්‍රසාද නිධාන සම්පූර්ණත්වයට පත්වන්නේ,

(i) ප්‍රසාද ස්නාපනය ලැබීම මගිනි. (ii) පූජකවරය ලැබීම මගිනි.

(iii) දිව්‍ය සත්ප්‍රසාදය ලැබීම මගිනි. (iv) අභිවෘද්ධියාලේපය ලැබීම මගිනි.

13. පාස්කු ඉරුදින සන්ධ්‍යාවේ උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ තම ශ්‍රාවකයන්ට දර්ශනය වෙමින්, ස්ථාපිත කරන ලද සක්‍රමේන්තුව වනුයේ,

(i) පූජකවරයයි (ii) දිව්‍ය සත්ප්‍රසාදයයි

(iii) සමගි සන්ධ්‍යානයයි (iv) ප්‍රසාද ස්නාපනයයි

14. සීනයි කඳු මුදුනේ දී දෙවියන් වහන්සේ දස පනත ලබා දුන්නේ,

(i) මෝසෙස් තුමාට ය. (ii) පේදුරු තුමාට ය.

(iii) ලූක් තුමාට ය. (iv) ආරොන්ට ය.

15. අන්‍ය ආගමික වත්පිළිවෙත් සිදු කිරීම, බාරහාර කිරීම......

(i) පළමු දේව පනතට විරුද්ධ ය. (ii) දෙවන දේව පනතට විරුද්ධ ය.

(iii) තෙවන දේව පනතට විරුද්ධ ය. (iv) හතරවන දේව පනතට විරුද්ධ ය.

16. ශුද්ධ බයිබලයේ සබත් දවස ශුද්ධ ලෙස ගත කිරීමට උපදෙස් දී ඇති එක් ග්‍රන්ථයකි.

(i) ලූක් ශුභාරංචිය (ii) නික්මයාම

(iii) උත්පත්ති පොත (iv) ජොහන් සුවිශේෂය

17. "නොවක් හිතකින් ඇත්ත පවසන්නේ" මෙම වගන්තිය ඇතුලත් දේව පනත වනුයේ,

(i) පළමු දේව පනතයි (ii) තෙවන දේව පනතයි

(iii) පස්වන දේව පනතයි (iv) අටවන දේව පනතයි

18. ක්‍රිස්තුස් වහන්සේ තමන් වහන්සේ අපෝස්තුළුවරුන්ට පැවරූ දූත සේවාව අඛණ්ඩව ලෝකය අවසානය දක්වා ගෙන යාමට ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධානය,

(i) දිව්‍ය සත්ප්‍රසාදයයි (ii) පූජකවරයයි

(iii) ආශිර්වාදකාර බන්ධනයයි (iv) අභිවෘද්ධි ආලේපයයි

19. "පියාණෙනි, ඔවුන්ට කමා වුව මැනව.... ඔවුන් කරන දෙය ඔවුන් නොදනිති." ක්‍රිස්තුස් වහන්සේ මෙලෙස ප්‍රකාශ කළේ,

(i) කුරුස ගසේ දී (ii) ජෙරුසලම් දේව මාළිගාවේ දී

(iii) ගෝලයන් තෝරා ගන්නා අවස්ථාවේ දී (iv) නාසරෙත් ධර්ම ශාලාවේ දී

20. ජේසුස් වහන්සේ යුදා ජාතීන්ගේ පමණක් නොව සියලු ජාතීන්ගේ ගැලවුම්කරුවාණන් බව අපට පෙන්වා දෙන ශුභාරංචිය වනුයේ,

(i) මතෙව් ශුභාරංචියයි (ii) මාක් ශුභාරංචියයි

(iii) ලූක් ශුභාරංචියයි (iv) ජොහාන් ශුභාරංචියයි

(2×20=40)

## II කොටස

* පළමු ප්‍රශ්නය ඇතුලත්ව ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.

01. සියලුම ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න.

(ii) ලූක් තුමා පිළිබඳ ප්‍රධාන කරුණු 02 ක් සඳහන් කරන්න.

(iii) පේදුරු තුමාගේ භාෂා පරිවර්තකයා ලෙස කටයුතු කර ඇති ශුභාරංචි කතුවරයා කවුද?

(iv) සෙබදි හා සලොම්ගේ පුතුන් වූ ජේසුස් වහන්සේගේ අපෝස්තුළුවරු දෙදෙනා නම් කරන්න.

(v) ඉන්පසු දෙවියන් වහන්සේ අපගේ ..... අනුව අපගේ ....... ලෙස මනුෂ්‍යයා මවමු. මෙහි හිස්තැන් සඳහා අදාළ පිළිතුරු ලියා දක්වන්න.

(vi) ජුසේ තුමා අයත් වංශය කුමක් ද?

(vii) රෝම අධිරාජ්‍යයේ සියලු වැසියන්ගේ සංගණනයක් ගැනීමට නියම කළ අධිරාජ්‍යයා කවුද?

(viii) ජේසුස් වහන්සේ බැලීමට පැමිණි ශාස්ත්‍රවන්තයන් ගෙන ආවේ මොනවාද?

(ix) මරිය තුමියගේ ඥාතිවරියක වූ ස්නාවක ජොහන් තුමාගේ මවගේ නම කුමක්ද?

(x) උන්වහන්සේ රොටි ගෙන තුති පුදා ඒවා කඩා ඔවුනට දී "....................." සම්පූර්ණ කරන්න.

(ලකුණු 2×10=20)

02. (i) ශුද්ධ බයිබලය බෙදෙන ප්‍රධාන කොටස් 02 නම් කරන්න. (ල. 02)

(ii) පංච පුස්තකය හඳුන්වන නම් තුනක් ලියන්න. (ල. 03)

(iii) ශුද්ධ බයිබලයෙන් ඔබට ඉගෙනගත හැකි ප්‍රධාන කරුණු 05 ක් ලියන්න. (ල. 05)

03. (i) ජේසුස් වහන්සේගේ අපෝස්තුළුවරයෙක් නොවන ශුභාරංචි කතුවරයා කවුද? (ල. 02)

(ii) මතෙව්, මාක්, ලූක් ශුභාරංචි වල සංකේතයන් පිළිවෙලින් නම් කරන්න. (ල. 03)

(iii) පංතියේ දුකට පත් අසරණ මිතුරෙකුට / මිතුරියකට ඔබ ශුභාරංචියක් වන අයුරු කරුණු 05 කින් ලියා දක්වන්න. (ල. 05)

04. (i) දෙවියන් වහන්සේ ලෝකය මවා එය පවරා දෙන්නේ කාටද? (ල. 02)

(ii) දෙවියන් වහන්සේ ලෝකය මවා මිනිසාට පැවරූ වගකීම් 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) දේව මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

05. (i) "විපුල ප්‍රසාද ලත් උත්තමාවිය ඔබට මංගල වේවා" මෙහි අවස්ථා සම්බන්ධය ලියා දක්වන්න. (ල. 02)

(ii) ජුදා ජාතීන්ගේ ආගමික චාරිත්‍ර 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) නත්තල් දිනයේ දී ඔබට ඔබේ පවුලේ අය සමග කළ හැකි යහපත් ක්‍රියා 05 ක් නම් කරන්න. (ල. 05)

06. (i) එක්වරක් පමණක් ලබාගත හැකි ප්‍රසාද නිධාන 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) ප්‍රසාද ස්නාපනයෙන් ඔබට ලැබෙන වරප්‍රසාද 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) ප්‍රසාද ස්නාපනයෙන් ඔබ ලත් නව ජීවිතය වර්ධනය කරගන්නා ආකාර 05 ක් ලියන්න. (ල. 05)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) රෝගීන්ගේ ආලේපය
(ii) දෙමව්පියන් වෙනුවෙන් අපේ යුතුකම්
(iii) හතරවන දේව පනත
(iv) දෙවන ජුවාම් පාවුලු මුනිතුමා

* * * * *

REGISTRAR
De Mazenod College
Kandana.